[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 6 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය I/II | පැය - 02 යි. |
|---|---|---|---|

නම ..........................................................................................................................................................

**සැලකිය යුතුයි.**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **I කොටසේ ප්‍රශ්නවල මෙම පත්‍රයේ ම පිළිතුරු සපයා II කොටසේ පිළිතුරු පත්‍රය සමග අමුණා භාර දෙන්න.**

## I කොටස

01. සිංහල අක්ෂර මාලාවේ ස්වර අක්ෂර පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

(i). ක, ග, ඉ, බ (ii). ප, ආ, ඒ, ස (iii). ඓ, ඔ, ඖ, ආ (iv). ය, ර, ල, ඊ

02. සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර සංඛ්‍යාව නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(i). 10 කි. (ii). 18 කි. (iii). 04 කි. (iv). 05 කි.

03. ඇලපිල්ල පමණක් යෙදී ඇති වචනය තෝරන්න.

(i). පිහිය (ii). කුරුසය (iii). තාරාවා (iv). පුටුව

04. විශේෂණ පද යටින් ඉරක් අඳින්න.

(i). පිරිසිදු ජලය පානය කරමු.

(ii). වන බඹරු පැණි බොති.

05. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පේළිය තෝරන්න.

(i). ළැහැබ, පොකුණ, පරිහරණය (ii). නිර්මානය, කුරුමිණියා, කොලය

(iii). ආරක්ෂාව, ප්‍රශ්ණ, කැටය (iv). වර්ශාව, ජලාසය, වදුල

- පහත සඳහන් වගන්තිවලට ගැළපෙන සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

06. (i). පැලට / පැළට) ගිය ගොවියා ගොයම් (පැල / පැළ) දැක සතුටු විය.

(ii). කුඩුවේ සිරවී (සරණක් / සරනක්) නැතිව සිටි කුරුල්ලා අහසේ (සරන / සරණ) කුරුල්ලෙකු දැක දුක් විය.

- අංක 07 සිට 10 තෙක් දී ඇති වාක්‍යවල හිස්නට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.

07. .............................. අහසේ පියාසර කරති. . (කුරුල්ලෝ / කුරුල්ලන්)

08. .............................. පොත් පාඩම් කරමි. (මා / මම)

09. අක්කා මල් වට්ටිය නංගී අතට ...................... (දුන්නේ / දුන්නාය)

10. ගංගා මුහුදට ගලා ................................ (බසී / බසින්නෝය)

- පහත සඳහන් වගන්තිවල යොදා ඇති විරාම ලක්ෂණ නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

11. අනේ ! ගිරවා මැරිලද ?
    (i). කොමාව සහ ප්‍රශ්නාර්ථ ලකුණ (ii). විස්මයාදී ලකුණ සහ ප්‍රශ්නාර්ථය
    (iii). කොමාව සහ දෙතිත (iv). ඇල ඉර සහ ප්‍රශ්නාර්ථය

12. උපාලි මහත්තයා , අර බලන්න.
    (i). කොමාව සහ තිත (ii). යුගල උඩු කොමාව සහ තිත
    (iii). ප්‍රශ්නාර්ථ ලකුණ සහ තිත (iv). තිත් හුල සහ තිත

13. ස්ත්‍රී ලිංග නාම පදයක් නොවන වචනය තෝරන්න.
    (i). වෙළඹ (ii). සෙබඩ (iii). සැවුලා (iv). මක්ෂිකාව

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවලට මුලින් දී ඇති පදයට සුදුසු විරුද්ධාර්ථ පදය තෝරන්න.

14. පිරිසිදු
    (i). සුපිරිසිදු (ii). අපිරිසිදු (iii). සුදුසු (iv). සුදෝසුදු

15. විදේශික
    (i). ආගන්තුක (ii). නේවාසික (iii). ස්වදේශික (iv). පිටරට

16. උණුසුම්
    (i). නිසල (ii). සිසිල් (iii). උෂ්ණ (iv). වියළි

- පහත සඳහන් වචනවලින් සුදුසු අනුක්ත පද තෝරා හිස්තැන් පුරවන්න.

  (අපි / මා / සිංහයෙකු / සිංහයෝ / කුරුල්ලන් / කුරුල්ලෙකු)

17. කුරුල්ලෝ ................................
18. සිංහයෙක් ................................
19. මම ................................

20. "නිදන්නේ ඇයි මේ ළමයෝ තවත් උදේ" මේ පද්‍ය පාඨය ඇතුළත් කවි පන්තිය කුමක් ද?
    (i). සිරිත් මල්දම (ii). ජාතික තොටිල්ල (iii). උදයසිරි (iv). දරු නැළවිල්ල

(මුළු ලකුණු 2×20=40යි.)

## II කොටස

- **01** සහ **02** ප්‍රශ්න අනිවාර්ය වේ. 03, 04, 05, 06, 07 ප්‍රශ්නවලින් තුනක් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

01. ගෙවත්තේ හමුවන කෘමි සතුන් ඇසුරින් ඔබ විසින් කරන ලද ක්‍රියාකාරකමට අදාළව පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i). කෘමි සතෙකු පිළිබඳව ඔබ උගත් පාඩමේ නම කුමක් ද? (ලකුණු 02)

(ii). ලිපියක් සකස් කිරීම සඳහා ඔබ විසින් තෝරා ගන්නා ලද කෘමි සත්ත්වයා නම් කරන්න. (ලකුණු 04)

(iii). කෘමි සත්ත්වයෙකු පිළිබඳව තොරතුරු සඳහන් කර ලිපියක් සකස් කිරීමට ඔබට පැවරූ ගුරුතුමිය ඒ සඳහා ඔබට ලබාදුන් උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv). ඔබ විසින් සකස් කරන ලද ලිපියට යෙදූ නම කුමක් ද? (ලකුණු 04)

(v). මේ කෘමි සතා පිළිබඳව තොරතුරු ඇතුළත් ලිපිය ලිවීමේ දී ඔබට මුහුණ දීමට සිදු වූ ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16යි.)

02. පහත මාතෘකා අතරින් එකක් තෝරා ගෙන (වචන 125ත් 150ත් අතර) වාක්‍ය රචනයක් ලියන්න.

(i). අපේ ජන කවි

(ii). මා කැමති ලේඛකයා

(iii). ජල සම්පත සුරකිමු.

(iv). උදෑසන අසිරිය

(v). දේශීය ආහාර පරිභෝජනය කරමු. (ලකුණු 14යි.)

03. ඔබේ පාසලෙන් දුර බැහැර පාසලකට මාරුවීමක් ලබා ගිය ආදරණීය සිංහල ගුරුතුමියට යවනු ලබන ලිපිය ලියන්න.

නැතහොත්

8 වන උපන්දිනය සමරන ඔබගේ සහෝදරියට සුදුසු උපන්දින සුබ පැතුම් පතක් සකස් කරන්න. (ලකුණු 10යි.)

04. පහත සඳහන් ප්‍රකාශ කවුරුන් විසින් කාහට කියන ලද දැයි වගුව තුළ ලියන්න.

| | ප්‍රකාශය | කාවිසින් | කාහට ද? |
|---|---|---|---|
| (i). | "අපි තොප විසින් අප හැමදෙන කෑ නොදෙම්හ." | | |
| (ii). | "ඈ අප්පේ කාට දැ කුමක් ද ඔබ කඬේ ගෙනියන්නේ ?" | | |
| (iii). | "සුරුට්ටු ද බොන්නේ බුලත් ම ද කන්නේ ?" | | |
| (iv). | "බොහොම ඉක්මනට ආවා නේද ?" | | |
| (v). | "අනේ පාදයෙනි, තොපට පින් සිදු වේවා." | | |

(ලකුණු 10යි.)

05. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"උගතුන් අතර පැතිරුණු සිංහල කවිය සංස්කෘත භාෂා ඥානය හා පොත්පත් මගින් උකහාගත් දැනුම මත සකස් වූවකි. සිංහලය හැර වෙනත් භාෂා නොදත් පොත පතෙහි පැතුරුණු දැනුමක් නැති පොදු ජනයා අතර කවි සම්ප්‍රදායක් විය. එය ජන කවිය නමින් හැඳින්වෙයි. ගැමියාගේ එදිනෙදා ජීවිතය ඇසුරෙන් ලද අත්දැකීම් පාදක කරගෙන බිහි වූ ජන කවි බෝහෝ ය. ජන කවියෙන් ගැමියාගේ දුක, සතුට, තනිකම ආදී හැඟීම් ප්‍රකාශ කර ඇත. විවිධ වෘත්තීන් ඇසුරෙන් නිර්මාණය වී ඇති ජන කවි අතර පැල් කවි, ගැල් කවි, නෙළුම් කවි, පාරු කවි ආදිය දැකිය හැකි ය."

(i). උගතුන් අතර පැතිරුණු සිංහල කවිය සඳහා ඔවුන් දැනුම ලබා ගන්නේ මොනවායින් ද?

(ii). පොදු ජනයා අතර ප්‍රචලිත කවි සම්ප්‍රදාය කිනම් නමකින් හඳුන්වයි ද?

(iii). ජන කවියෙන් ප්‍රකාශවන ගැමියාගේ හැඟීම් දෙකක් ලියා දක්වන්න.

(iv). ඉහත ඡේදයේ සඳහන් නොවන ඔබ දන්නා වෙනත් ජන කවි වර්ග දෙකක් ලියන්න.

(v). ඔබ ඉගෙන ගෙන ඇති, ඔබ දන්නා ජන කවියක් ලියන්න. (ලකුණු 2×5=10යි.)

06. පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"හිස අවුල් කරගෙන
කිළුටු වැරහැලි ඇඳගෙන
පඹයෙකුගේ විලසින
ඉඳම හොඳ නෑ බූත කරමින"

(i). මෙම කවිය උපුටා ගෙන ඇති ග්‍රන්ථය කුමක් ද?

(ii). "වැරහැලි" හා "බූත" යන පදවල තේරුම ලියන්න.

(iii). මෙහි දැක්වෙන උපමාව ලියා දක්වන්න.

(iv). මේ කවියේ සඳහන් වන යහපත් පුරුදු දෙකක් ලියන්න.

(v). මේ කවිය උපුටා ගෙන ඇති ග්‍රන්ථයේ රචකයා කව්රුන් ද? (ලකුණු 2×5=10යි.)

07. පහත සඳහන් පාඨ උපුටා ගත් ග්‍රන්ථ හා කතුවරුන් ලියා දක්වන්න.

| | පාඨය | උපුටා ගත් ග්‍රන්ථය | කතුවරයා |
|---|---|---|---|
| (i). | "මේ තඩ ගිනි යන්නේ තොපේ නැන්දලෑ දිහාට" | | |
| (ii). | "ඉර උදාවන්නට පළමුව නැගිට සිහිකොට ............" | | |
| (iii). | "අසලැ වූ ගෙකැ අත්තක් මගේ සොඬට පැමිණියේ යැ" | | |
| (iv). | "අග්ගලා නමින් සාදා ගත්තා තවත් රස කැවිලි වර්ගයක් වෙයි" | | |
| (v). | "ශරත් අපි එක්ක බෝට්ටුවෙන් යන්න තව අඩි දෙකක් විතර උස් වෙන්නට ඕනෑ" | | |

(ලකුණු 2×5=10යි.)

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

**මතුගම අධ්‍යාපන කලාපය**

## දෙවන වාර ඇගයීම - 2023

| 6 ශ්‍රේණිය | විෂයය – සිංහල භාෂාව හා සාහිත්‍යය | පිළිතුරු |
|---|---|---|

### I කොටස

01. (iii)
02. (iv)
03. (iii)
04. (i) පිරිසිදු (ii) වන බඹරු
05. (i)
06. (i) <u>පැලට</u> ගිය ගොවියා ගොයම් <u>පැළ</u> දැක සතුටු විය.
    (ii). කුඩුවේ සිරවී <u>සරණක්</u> නැතිව සිටි කුරුල්ලා අහසේ <u>සරන</u> කුරුල්ලෙකු දැක දුක් විය.
07. කුරුල්ලෝ
08. මම
09. දුන්නාය.
10. බසී
11. (ii)
12. (i)
13. (iii)
14. (ii)
15. (iii)
16. (ii)
17. කුරුල්ලන්
18. සිංහයෙකු
19. මා
20. (iii)

### II කොටස

01. ඇගයීම් ප්‍රශ්නය

(i). ඇවිදින කොළයා පාඩම

(ii). ප්‍රශ්නයට අදාළව දරුවන් ලියා ඇති කෘමි සත්ත්වයාට ලකුණු ලබා දෙන්න. (මී මැස්සා, බඹරා, තණකොළ පෙත්තා)

(iii). 1. නියමිත දිනයට ලිපිය බාර දෙන්න.
2. පැහැදිලි අත් අකුරින් ලියන්න.
3. චිත්‍ර හා රූප සටහන් අඳින්න හෝ අලවන්න.
ආදී පිළිතුරු දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(iv). දරුවන් ලියා ඇති නමට සුදුසු ලෙස ලකුණු ලබා දෙන්න.
(මල නොතලන වන බඹරු / මල් මිහිර සඳන මී මැස්සා)

(v). 1. කෘමි සත්ත්වයා පිළිබඳව තොරතුරු සොයා ගැනීමට අපහසු වීම.
2. ලිපිය සකස් කිරීමට කාලය ගතවීම නිසා නියමිත දිනයට බාරදිය නොහැකි වීම.
3. චිත්‍ර හා රූප සටහන් සොයාගත නොහැකි වීම.

02. රචනාව සඳහා

- මාතෘකාව සමග හැඳින්වීම. - ලකුණු 04
- අන්තර්ගතය සහ ප්‍රමාණවත් බව - ලකුණු 06
- ශිල්පීය දක්ෂතා - ලකුණු 04 (මුළු ලකුණු 14)

03. පෞද්ගලික ලිපිය සඳහා

- ආකෘතිය - ලකුණු 02
- අන්තර්ගතය - ලකුණු 05
- ශිල්පීය දක්ෂතා - ලකුණු 03 (මුළු ලකුණු 10)

04.

| ප්‍රකාශය | කාවිසින් | කාහට ද? |
|---|---|---|
| (i). | බෝධි සත්ත්වයෝ | රකුසාට |
| (ii). | නරියා විසින් | ඉබ්බා ඔසවාගෙන ගිය මාන කොකුන්ට |
| (iii). | නරියා විසින් | ගමරාලට |
| (iv). | විමලා විසින් | සමර වික්‍රමට |
| (v). | අලියා විසින් | තමාටම |

05. ඡේදය ඇසුරින්

(i). සංස්කෘත භාෂා ඥානය හා පොත්පත් මගින්

(ii). ජන කවි

(iii). සතුට, තනිකම

(iv). බඹර කවි, පතල් කවි, ගොයම් කවි ආදී ලෙසට ප්‍රශ්නයට අදාළව දරුවන් ලියා ඇති කවි වර්ග 2 කට

(v). දරුවන් ලියා ඇති ජන කවියට සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

06. කවිය ඇසුරින්

(i). සිරිත් මල්දම

(ii). වැරහැලි - ඉරුණු රෙදි / පරණ රෙදි

බූත - කෝලම් / වැඩකට නැති වැඩ

(iii). පඹයෙකුගේ විලසිත

(iv). හිස පීරාගෙන පිළිවෙලට තබා ගැනීම.

කිළුටු ඇඳුම්, ඉරුණු වැරහැලි ඇඳුම් නො ඇඳීම.

(v). ඇම්.ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්

07.

| පාඨය | උපුටා ගත් ග්‍රන්ථය | කතුවරයා |
|---|---|---|
| (i). | වටු කිරිල්ලී සහ තවත් කතා | ඒ. පී. ගුණරත්න |
| (ii). | සිරිත් මල්දම | ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් |
| (iii). | කියවන නුවණ | කුමාරතුංග මුනිදාස |
| (iv). | අග්ගලාකං ඩෝං පුතා | ඩේවිඩ් කරුණාරත්න |
| (v). | රණරාළ | ජී. බී. සේනානායක |


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න